**ශීර්ෂය 299 - ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**

**-----------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 මතය**

**---------**

ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුලි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**-----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය

යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 හා 05 වගන්ති | එක් එක් නිලධාරියා වෙනුවෙන් කාර්යසාධන ගිවිසුම් අත්සන් කර, දෙපාර්තමේන්තුව තුළ කටයුතු කරනු ලබන මානව සම්පත සැලසුම් සහගතව සංවර්ධනය කිරීම වෙනුවෙන්, මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එසේ කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, 2020 වර්ෂයේ දී සහකාර අධ්‍යක්ෂක (සැලසුම්) පුරප්පාඩුව සම්පූර්ණ වූ පසුව ආරම්භ කළ අතර, අදාළ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී, වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම, මාණ්ඩලික නිලධාරීන් සඳහා සම්පූර්ණ කර කළ නමුත් සමස්ත කාර්යය මණ්ඩලය සඳහා ම එය සම්පූර්ණ කර ගත නොහැකි විය. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 වර්ෂයේ කළ අයවැය යෝජනාවකට අනුව වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමට පහසුකම් සපයන මැඩ්රිඩ් සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශවීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණි. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සර්වර් යන්ත්‍ර මිලදීගැනීම, ස්ථාපනය හා නඩත්තු කටයුතු සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනය **(ICTA)** තෝරාගෙන තිබූ අතර 2016 දෙසැම්බර් 30 දින එම ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම අනුව මාස 06 ක කාලයකින් අදාළ කාර්යය නිම කළ යුතු අතර වසර තුනක් තුළ ගෙවිය යුතු රු.මිලියන 7.5 ක නඩත්තු වියදමද සමඟ රු.මිලියන 32.5 ක් ගිවිසුම්ගත දිනම අදාළ ආයතනයට ගෙවා තිබුණි. ගිවිසුම් ගත පරිදි අදාළ කාර්යය ඉටු නොකිරීම නිසා නැවත වරක් එම ආයතනය සමග ගිවිසුමකට එළඹීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාළ අමාත්‍යාංශ ලේකම්ට 2020 පෙබරවාරි 20 දිනැති අංක අමප/20/0139/215/009 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් දී තිබූ උපදෙස් පරිදි ඉදිරිපත් කළ කෙටුම්පත් අවබෝධතා ගිවිසුමට නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ 2021 අගෝස්තු 20 දින ලැබී තිබුණි. එසේ වුවද 2022 අප්‍රේල් 30 දින වන විටත් ඒ සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි. එමෙන්ම මෙම ගිවිසුමට ප්‍රවේශවීමේදී බුද්ධිමය දේපළ පනතට විය යුතු සංශෝධනයන් කිරීම සඳහා 2020 පෙබරවාරි 20 දිනැති අංක අමප/20/0154/215/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලැබී | 2020 පෙබරවාරි මස 20 දිනැති අංක අමප/20/0139/215/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ICTA ආයතනය සමඟ නැවත ගිවිසුමකට එළඹීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් නිරීක්ෂණ සලකා බලා එම නිරීක්ෂණ අනුව සංස්කරණය කරන ලද ගිවිසුමේ කෙටුම්පත නිරීක්ෂණ සඳහා 2022 පෙබරවාරි 17 වන දින ICTA ආයතන වෙත යවන ලද අතර, එම කෙටුම්පත සඳහා පළමු සිහිකැඳවීම් ලිපිය ද 2022 අප්‍රේල් 04 වන දින ICTA ආයතන වෙත යවන ලදී. | කාල පමාවකින් තොරව අදාල කාර්යය කඩිනමින් ඉටුකර ගැනීම සඳහා ගිවිසුම් ගතවී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ගත යුතුය. |

ඇතත්, මූලික කෙටුම්පත නීතිපති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවෙන් සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මස ලැබීමෙන් පසු ඒ සම්බන්ධයෙන් වෙනත් ඉදිරි ක්‍රියාමාර්ග සිදු කර නොතිබුණි.

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණක තනතුර **2019** වර්ෂයේ අප්‍රේල් මස සිට අනුමත කර ඇතත් මෙතෙක් එම තනතුර පුරප්පාඩු වී තිබීම නිසා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ විධිවිධාන ඉටුවී නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්යයන් ආරම්භ කිරීමට සුදුසු නිලධාරියෙකු අනියුක්ත කර ගැනීමට රේඛීය අමාත්‍යාංශය හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීම කර ඇති බැවින් හා සිහි කැඳවීම් ද යොමු කර ඇත. | පනතේ විධිවිධාන වලට අනුකූල විය යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| (අ) ද්විතීයික මට්ටමේ පැවති පුරප්පාඩු 13 න් 09 ක් පේටන්ට් පරීක්ෂක තනතුර වෙනුවෙන් වූ අතර, එම තනතුරට අදාළ අනුමත සේවක සංඛ්‍යාව 10 කි. ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 90 ක ප්‍රතිශතයක් වසර 5 ක කාලයක සිට පුරප්පාඩු වී තිබුණි. එම තනතුරුවල දැනට කටයුතු කරන සංවර්ධන නිලධාරීන් තිදෙනෙකුව බඳවාගැනීමේ පරිපාටිය සංශෝධනය කර විභාගයකින් තොරව බඳවාගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කර තිබුණි. | සේවක පුරප්පාඩු සඳහා නිලධාරීන් පත් කර ගැනීමට රේඛීය අමාත්‍යාංශය හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීම කර සිහි කැඳවීම් ද යොමු කර ඇත. | පේටන්ට් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියට සෘජුව සම්බන්ධ වන බැවින් බඳවාගැනීම් ප්‍රමාද නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ පවත්නා පුරප්පාඩු 02 සඳහා ඉල්ලීම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදීද එම පුරප්පාඩු සම්පූර්ණ වී නොතිබුණි. | සේවක පුරප්පාඩු සඳහා නිලධාරින් පත් කර ගැනීමට රේඛීය අමාත්‍යාංශය හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීම කර සිහි කැඳවීම් ද යොමු කර ඇත. | දෙපාර්තමේන්තුවට තොරතුරු හා සන්නිවේදන ජාලයක් ස්ථාපිත කිරීමට සැලසුම් කරන බැවින් එම තනතුරුවල නිලධාරීන්ගේ අවශ්‍යතාව සපුරාගත යුතුය. |